State Government Victoria
Department of Education and Early Childhood Development

Literacy tips to help your child
Before School - Year 2
Sinhalese

# ඔබේ ළමයාට උදව් කිරීම සඳහා සාක්ෂරතා හෝඩුවාවල්

පාසැල් යාමට පෙර - **2** වසර

## සෑම ළමයෙක්ටම, සෑම අවස්ථාවක්ම









# ඔබේ ළමයාට කියවීමට, ලිවීමට, කතා කිරීමට සහ සවන් දීමට උදව් කිරීම

පවුල් විසින් ළමයෙකුගේ වර්ධනය කෙරෙහි ප්‍රථම සහ වඩාත් කල් පවත්නා බලපෑමක් ඇති කරනු ලබන අතර ළමයාගේ ඉගෙනීම කෙරෙහි වැදගත් කාර්යභාරයක් ද ඉටු කරනු ලැබේ.

ක්‍රීඩා කිරීම සහ එදිනෙදා පවුලේ ක්‍රියාකාරකම් තුලින් තම ළමයාගේ කථනයේ, සවන් දීමේ, කියවීමේ සහ ලිවීමේ කුසලතා බොහෝ අයුරින් වර්ධනය කිරීමටත්, ඊට උදව් කිරීමටත් ඔබට විවිධ මාර්ග ඇත.

ඔබ හෝ අනෙකුත් පවුලේ සාමාජිකයන් විසින් එදිනෙදා ක්‍රියාකාරකම් තුලින් ඔබේ ළමයාගේ සාක්ෂරතා හැකියාවන් වර්ධනය උදෙසා කලහැකි දේවල් ගැන මෙම පත්‍රිකාවෙන් හෝඩුවාවල් සපයනු ලැබේ.

ඔබේ ළමයාගේ පලමු භාෂාවෙන් සහ, ඔබට විශ්වාසයක් තිබේ නම් ඉංග්‍රීසියෙන්ද ළමයා මෙම ක්‍රියාකාරකම් වලට සම්බන්ධ කර ගැනීම ඉතා ඵලදායක වියහැකිය.

මෙම පත්‍රිකාවේ විද්‍යුත් සංස්කරණ ඉංග්‍රීසි සහ වෙනත් භාෂා 23කින් Families as Partners in Learning වෙබ් අඩවියෙන් ලබාගත හැකිය: **www.education.vic.gov.au/about/directions/familiesaspartners/schools/connecting.htm**

## මට උදව් ලබාගත හැක්කේ කොතැනින්ද?
## ඔබේ ළමයාගේ ගුරුවරයාගෙන්

ඔබේ ළමයාගේ සාක්ෂරතා හැකියාවන් වර්ධනය උදෙසා ඔබට උදව් කලහැකි අයුරු ගැන උපදෙස් ඔබේ ළමයාගේ ගුරුවරයාට ඔබට සැපයිය හැකිය. ගුරුවරයා සමග ඔබට සාකච්ඡා කලහැකි මාතෘකා සමහරක්:

- සාක්ෂරතා කාර්යයන් හිදී ඔබේ ළමයාගේ සාධන මට්ටම.
- ඔබේ ළමයා ලඟාවීමට ක්‍රියාකරන සාක්ෂරතා ඉලක්ක, සහ ඔබේ ළමයාට එම ඉලක්ක වලට ලඟාවීමට ඔබ විසින් උපකාර කලහැකි අන්දම.
- ඔබේ ළමයා මුහුනපාන දුෂ්කරතා අංශයන්හිදී ඔහුට හෝ ඇයට උපකාර කිරීමට ඔබ විසින් භාවිතා කලහැකි උපක්‍රම.

## මාර්ගගත සම්පත්

වික්ටෝරියානු රජයේ නව *Connect-Primary* වෙබ් අඩවිය මගින් ඔබේ නිවසේ පරිගණකය, ඔබේ ප්‍රදේශයේ පුස්තකාලයේ පරිගණකය හෝ පාසැල ඔස්සේ වැදගත් ඉගෙනුම් මෙවලම් (learning tools) හා සම්බන්ධවීමට පහසු කරයි.

*Connect-Primary* වෙබ් අඩවියට මෙතැනින් පිවිසෙන්න: **http://www.education.vic.gov.au/primary**

*Connect-Primary* හි අන්තර්ගත අඩවි ළමයින්ගේ භාවිතය සඳහා උචිත බව තහවුරු කිරීම සඳහා ගුරුවරුන් විසින් පිරික්සා බලා සහතික කර ඇත.

මතක තබාගන්න: *Connect-Primary* වෙබ් අඩවියෙහි අඩංගුකර නැති වෙනත් වෙබ් අඩවිවලට ඔබ පිවිසෙන්නෙහිනම්, ඔබේ ආරක්ෂාව සඳහා, ඔබේ නම, ඔබේ ළමයාගේ සම්පූර්ණ නම, පාසැල, දුරකතන අංකය හෝ ලිපිනය වැනි පුද්ගලික තොරතුරු ඔබ නොදන්නා කිසිම පුද්ගලයකුට මාර්ගගතව කිසිම විටක නොදිය යුතුය.

*Ultranet* යනු පාසැලේදී ඔබේ ළමයාගේ ඉගෙනීම ගැන තොරතුරු ඔබට සපයන නව මාර්ගගත පද්ධතියකි. එය සිසුන්ට, දෙමාපියන්ට සහ ගුරුවරුන්ට අන්තර්ජාලය හරහා පිවිසිය හැකි ප්‍රාන්තය පුරා විහිදෙන, සුරක්ෂිත වෙබ් අඩවියකි. *Ultranet* වෙබ් අඩවියට මෙතැනින් පිවිසෙන්න: **www.education.vic.gov.au/about/directions/ultranet/benefits/parents.htm**

## දෛනික ක්‍රියාකාරකම් තුලින් නිවසේදී සම්බන්දතා ඇතිකර ගැනීම



- ඔබ සමග හවුලේ කවි සහ සිංදු ගැයීමට ඔබේ ළමයාව උනන්දු කරවන්න.
- ඔබේ ළමයාට ඇහුම් කන් දෙන්න, ඔවුන්ගේ අදහස් පිලිබඳව ප්‍රශ්ණ අසමින් සහ එවා ගැන වැඩිදුර තොරතුරු අසමින් ප්‍රතිචාර දක්වන්න.
- ඔබ වටා ඇති අකුරු සහ වචන පෙන්වමින් එවා ගැන කතා කරන්න. උදාහරණයක් වශයෙන්, ධාන්‍ය ආහාර අසුරන පෙට්ටි (cereal boxes), මෝටර් රථ අංක තහඩු, නාම පුවරු.
- ඔවුන් හා එක්ව සරල ආහාර පිසින්න. ආහාර පිළියෙළ කිරීමේ වට්ටෝරුව කියවන්න, ඔබ කරන ක්‍රියාව ගැන කතාබහ කරන්න.
- සෙල්ලම් බඩු පුස්තකාලයකට (toy library) බැදී හවුලේ සෙල්ලම් බඩු තෝරන්න.
- ප්‍රචාරක තැපැල (junk mail) බලමින් විකිණීමට ඇති දේවල් ගැන කතා කරන්න.
- පවුලේ ජායාරූප සහ එවායේ ඉතිහාසය ගැන කතා කරන්න.

## කතන්දර කීම

කතන්දර කීම ඔබේ ළමයාගේ භාෂා සහ සවන් දීමේ කුසලතා දියුණු කිරීමටත්, පරිකල්පනය විවෘත කිරීමටත් වැදගත් මාර්ගයකි. එක්කෝ ඔබට කතන්දරය කීමට පුලුවන, නැතිනම් ඔබේ ළමයාට කතන්දරය කීමට උනන්දු කිරීමට පුලුවන.

මේ දේවල් ගැන කතන්දර කීමට පුලුවන:

- පොතක හෝ රූපවාහිනී වැඩසටහනක සිත්ගත් චරිතයක් ගැන.
- පවුලේ අනික් සාමාජිකයෙක් ගැන.
- ඔබේ ළමයාගේ ප්‍රියතම සෙල්ලම් බඩුව ගැන.



ඔබේ කතන්දර කීම පටන් ගැනීමට උපදෙස් සමහරක්:

- විවිධ කටහඬවල්, රූකඩ, ආධාරක (props) හෝ අතැඟිලි රැඟුම් (finger play) යොදා ගැනීමෙන් කතන්දරය ප්‍රබෝධමත් කරන්න.
- ඔබේ ළමයා ඇලුම් කරන දේකින් පටන් ගන්න.
- චරිතයක් සහ පසුබිමක් නිර්මාණය කරන්න.

## එක්ව කියවීම

කියවීම, කතා කරන වචන සහ ලියන වචන අතර සබඳතාවය ඇති කිරීමේ වැදගත් මගකි.

ඔබේ ළමයාට කියවාදීම ඉතා වටිනා දෙයකි. උපදෙස් සමහරක්:



- ඔබේ ළමයාටම පොත්, සඟරා, නාමාවලි (catalogues), බහුමාධ්‍ය කතන්දර හෝ ඩීවීඩී (DVD) තෝරාගැනීමට උනන්දු කරන්න.
- පොතක තිබෙන පින්තූර සාකච්ඡා කර ඔබේ ළමයාට පින්තූර ගැන කතා කිරීමට උනන්දු කරන්න.
- වචන රහිත පින්තූර පොත් හවුලේ බලා එම පින්තූරවලින් පෙන්වන දේවල් නම්කිරීමෙන් පරිකල්පනය, අදහස් සහ වචන සමුදාය වර්ධනයට ඉඩ සලසන්න.
- ඔබේ ළමයාගේ ප්‍රියතම පොත් සහ කතන්දර නැවත කියවන්න.
- ඔබේ ළමයාට පින්තූරද ඇතුළත් තමන්ගේම පොත් සදාගැනීමටත් ඉන්පසු එම කතන්දරය ඔබට කියවීමටත් උදව්කරන්න.

ඔබේ ළමයා කතන්දරයට හොඳින් සුපුරුදුවී, කියවීමේ කාර්යයෙන් කොටසක් භාර ගැනීමට හැකියාව ලබාගත්විට ඔබේ ළමයා *සමග* කියවීම ආරම්භ වනු ඇත.

ඔබේ ළමයා *ඔබට* කියවනවිට, වචන හඳුනා ගැනීමට කාලය දෙන්න, ඔහු හෝ ඇය කියවූ දේ තේරුම් ගෙන ඇති දැයි ප්‍රශ්න අසා දැන ගන්න.




සෑම දිනකම වෙනත් වෙනත් අරමුණු සඳහා ඔබ කියවන ආකාරය ඔබේ ළමයාට පෙන්වාදීම වැදගත්ය. උදාහරණ ලෙස: කෑම පිළියෙළ කිරීමේ වට්ටෝරු, සුබ පැතුම් පත්, දින දර්ශන, සාප්පු බඩු ලැයිස්තු, ආහාර ලේබල, උපදෙස්, සිතියම්, පුවත් පත්, ඊමේල්, සලකුණු, වෙබ් අඩවි යනාදිය.

*පොත් ගැන කතාකිරීම (Book talk)* කියවීමේ වැදගත් අංගයකි. පොතක් කියවීමට පෙර, කියවන අතර සහ කියවූවාට පසු පොත පිළිබඳව කතාකර ඔබේ ළමයාට තම අදහස් ගැන කතා කිරීමට ඇත්ත වශයෙන්ම උනන්දු කරන්න, පොත ගැන ප්‍රශ්න අසන්න. පොත කියවීමට පෙර, කියවන අතර සහ කියවූවාට පසු ඔබට ඇසිය හැකි ප්‍රශ්න සමහරක් නම්:

- ඔබ කියවීමට කැමති කුමන දේ ගැනද?
- ඔබ දන්නා පොතක් තෝරා ගැනීමට ඔබ කැමතිද?
- කවරය දෙස බලන්න ඔබ සිතන විදිහට මේ පොත කුමක් ගැන ලියැවුනු එකක්ද?
- පින්තූර වලින් පෙන්වන්නේ කුමක්ද?
- ඔබ සිතන විදිහට ඊළඟට සිදුවන්නේ කුමක්ද?
- ඔබට පොතේ වඩාත් ප්‍රියතම කොටස කුමක්ද?
- ඔබට කතන්දරයේ වඩාත් ප්‍රියතම චරිතය කුමක්ද? ඔබ එම චරිතයට කැමති මන්ද?
- ඔබට මේ පොතේ අවසානය වෙනස්කල හැකිනම්, ඔබේ අවසානය කුමක්ද?

## කියවීමට අදහස්



- ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ *Quiz* සබැඳිය තෝරා බලා හවුලේ ප්‍රහේලිකා විසඳන්න.
- ඔබේ ළමයා ඔබට තම අත්දැකීමක් ගැන කියන දේ සටහන් කරගන එය නැවත හවුලේ කියවන්න.
- ඔබ පෙදෙසේ පුස්තකාලයට හෝ පාසැල් පුස්තකාලයට ගොස් හවුලේ පොත් තෝරාගෙන හවුලේ කියවන්න.
- ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ *Find out* සබැඳිය තෝරාගෙන ලෝකය පිළිබඳ කරුණු සොයාගන්න.

- චරිත හෝ දර්ශන ගැන පින්තූර අඳින්න හෝ පාට කරන්න. ප්‍රාථමික සිසුන් සඳහාවූ *FUSE* වෙබ් අඩවියේ *Draw* සබැඳිය තෝරාගන්න.



- ශබ්ද කෝෂයක් භාවිතා කරමින් වචන සෝදිසි කරන්න.
- කතුවරු සහ චිත්‍රණකරුවන්ගේ කාර්යභාරය ගැන කතා කරන්න.
- යම් පොතක් පිළිබඳ වැදගත් කරුණු පෙන්වාදෙන්න - පිට කවරය, නාරටිය, පටුන පිටුව, පොතේ නම යනාදිය.

## කියවීම සහ ලිවීම එකිනෙකට අත්වැල් බැඳගෙන සිටී

ලිවීමට ඉගෙනීම පටන් ගැනෙන්නේ කුරුටුගෑම සහ ඇඳීමෙනි. මෙය වැදගත් පළමු පියවරක් බැවින් එය උනන්දු කල යුතුය. ඔබේ ළමයාට තමන් ලියූ දේ හඬනගා කියවීමට උදව් කරන්න. ඔවුන් ලියූ දේ තැන්පත් කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට තැනක් සාදා දෙන්න.

කතා කිරීම, ලිවීම සහ කියවීම අතර සබඳතා ගොඩනැගීම සඳහා ඔබේ ළමයාගේ අත්දැකීම් ප්‍රයෝජනයට ගන්න. මේ සඳහා අනුගමනය කලහැකි පියවර සමහරක්:




- ඔබේ ළමයාගේ අත්දැකීමක් හෝ තමන්ට සිත්ගත් දෙයක් ගැන කතා කරන ලෙස ඉල්ලා සිටින්න.
- යම් සංවාදයක කුමන කොටස ඔබ විසින් ලිවිය යුතුදැයි ඔබේ ළමයාගෙන් අසන්න.
- ඔබේ ළමයා කතාකරන අතරතුර ඔවුන්ගේ අදහස් සටහන් කර ගන්න. ළමයාගේ භාෂාවම භාවිතා කරන්න.
- ලියූ දේ පෙරලා කියවන ලෙස ඔබේ ළමයාගෙන් ඉල්ලා සිටින්න.
- ලියූ දේ සමග ගැලපෙන සේ පින්තූරයක් ඇඳීමට හෝ කිසියම් දෙයක් නිර්මාණය කිරීමට ඔබේ ළමයාට උවමනා විය හැකිය.

## නිවසේදී සැමදා ලිවීමට අවස්ථාවන්:

කියවීම මෙන්ම, ලිවීමද නිවසේ එදිනෙදා කාර්යයක් බවට පත්වේ. ඔබ ලියන අන්දම ඔබේ ළමයාට පෙනෙන්නට ඉඩ හරින්න.

මේ ලිවීමේ අදහස් සමහරක් නිවසේදී අත්හදා බලන්න:

- සාප්පු බඩු ලැයිස්තුවක් ලියන්න, නැතහොත් ලැයිස්තුවට අංග එකතු කරන්න, එම බඩු ඔබ මිලට ගත්විට හෝ අසුරනයෙන් එලියට ගන්නාවිට ලැයිස්තුවෙන් කපා හරින්න.




- පවුලේ පණිවුඩ ලිවීමට සහ කියවීමට පුවරුවක් තබාගන්න.
- ඔබේ සතිපතා ආහාර වට්ටෝරුවට අඩංගු කෑම වර්ග හවුලේ සැලසුම් කර ලියන්න.
- ඔබේ පවුලේ ඇල්බමයන්හි ඇති ඡායාරූපවලට සිරස්තල ලියන්න.
- ඔබේ ළමයාගේ චිත්‍ර සහ නිර්මාණ සඳහා ලේබල ලියන්න.
- සුබපැතුම් පත්, උපන්දින කාඩ් සහ ස්තුති සටහන් නිමවා ලියන්න.
- පවුලේ දින දර්ශනයක් තබාගන පවුලේ සිදුවීම් එහි ලියන්න. ලඟ එන සිදුවීම් ගැන ඔබේ ළමයා සමග කතා කරන්න, උදාහරණයක් ලෙස, සිදුවීමේ ස්ථානය, දිනය, සහ ඊට සහභාගි වන පුද්ගලයන්.

## ප්‍රාන්ත අගමැතිගේ කියවීම් අභියෝගය (Premier's Reading Challenge)

ප්‍රාන්ත අගමැතිගේ කියවීමේ අභියෝගය වික්ටෝරියානු සිසුන්ට තම කියවීම වැඩි දියුණු කරගැනීමට මාහැඟි අවස්ථාවකි. නියමිත ඉලක්ක කරා යාම පිණිස සිසුන්ට පොත් 30ක් කියවීමට හෝ අත්දැකීමට උනන්දු කරවනු ලැබේ. ඔබේ ළමයා කියවීමට යම්තම් ඉගෙන ගනිමින් සිටින්නේ නම්, ඔවුන්ට පොත් අත්දැකීම ලබාගැනීම සඳහා උදව්වක් ලෙස ඔබ විසින් පොත් ඔවුනට/ඔවුන් සමග කියවීමට හෝ කතන්දරය, වචන සහ පින්තූර ගැන කතා කිරීමට පුලුවන. ප්‍රාන්ත අගමැතිගේ කියවීමේ අභියෝගය ගැන මෙතැනින් පිරික්සා ගන්න:

**http://www.education.vic.gov.au/prc/default.htm**